බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Department of Education Westerns Province

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025**
**General Certificate of Education (Adv. Level) Examination, 2025**
**අවසාන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය**

| | | |
|---|---|---|
| **භෞතික විද්‍යාව I**<br>**Physics I** | **01 S I** | පැය දෙකයි<br>**Two hours** |

**උපදෙස් :**

- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 50ක් පිටු 10ක අඩංගු වේ.
- **සියලුම** ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- පිළිතුරු පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
- පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් සැලකිලිමත්ව කියවන්න.
- 1 සිට 50 තෙක් වූ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි** හෝ **ඉතාමත් ගැළපෙන** හෝ පිළිතුර තෝරා ගෙන, එය, **පිළිතුරු පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයකින්** (×) **ලකුණු කරන්න.**

**ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.**

$(g = 10ms^{-2})$

**1.** පහත ප්‍රකාශ අතුරින් වෙනස් මාන ලබා දෙන ප්‍රකාශනය තෝරන්න.

(1) පීඩනය × පරිමාව
(2) විභවය × ආරෝපණය
(3) ප්ලාන්ක් නියතය × සංඛ්‍යාතය
(4) ස්කන්ධය × විශිෂ්ට ගුප්ත තාපය
(5) ප්‍රත්‍ය බලය × වික්‍රියාව

**2.** නියත පරිමාවක් සහිත බඳුනක අඩංගු පරිපූර්ණ වායුවක අචල ස්කන්ධයක් ජලයේ ත්‍රික ලක්ෂ්‍යයේ තැබූවිට එහි පීඩනය $P_{tr}$ විය. එහි පීඩනය $P$ ලෙස දක්වන විට උෂ්ණත්වය වන්නේ,

(1) $273.16\left(\frac{P-P_{tr}}{P}\right) K$
(2) $273.16\left(\frac{P-P_{tr}}{P_{tr}}\right) K$
(3) $273.16\left(\frac{P}{P_{tr}}\right) K$
(4) $273.16\left(\frac{P_{tr}}{P}\right) K$
(5) $273.16\left(\frac{P+P_{tr}}{P_{tr}}\right) K$

**3.** නාභි දුර $f$ වූ අභිසාරී කාචයකින් ලබා ගත් තාත්වික ප්‍රතිබිම්බ සඳහා වස්තු දුර $u$ සමඟ ප්‍රතිබිම්බ දුර $v$ වෙනස් වූ ආකාරය ප්‍රස්තාරයේ $A$ වක්‍රයෙන් දැක්වේ. ප්‍රස්තාරයේ මූල ලක්ෂ්‍යය හරහා $x$ අක්ෂයට 45° ආනත වන සේ ඇඳි රේඛාව $B$ වේ. $A$ හා $B$ හි ඡේදන ලක්ෂ්‍යයේ $(P)$ ඛණ්ඩාංක වන්නේ,




(1) $\left(\frac{f}{2},\frac{f}{2}\right)$
(2) $(f,f)$
(3) $(2f,2f)$
(4) $\left(\frac{3f}{2},\frac{3f}{2}\right)$
(5) $(4f,4f)$

**4.** නුගැසුම් ඇතිවීම සම්බන්ධයෙන් කර ඇති පහත ප්‍රකාශ සලකා බලන්න.

(A) සර්වසම සංඛ්‍යාත හා ආසන්න විස්තාර සහිත ප්‍රභව දෙකක් එකවර නාද කිරීමෙන් ඇති වේ.
(B) අධිස්ථාපන මූලධර්මය මගින් පැහැදිලි කළ හැකිය.
(C) ධ්වනි තරංග දෙකක සමකලාස්ථ තරංග එකට හමු වීමේ දී හඬේ සැර වැඩි වීමක් ශ්‍රවණය කළ හැකිය.

මේවායින් සත්‍ය වන්නේ,


iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(1) (A) පමණි (2) (B) පමණි (3) (C) පමණි
(4) (A) හා (B) පමණි (5) (B) හා (C) පමණි

5. විශාලත්වය 5 $N$ බැගින් වන බල දෙකක් රූපයේ දැක්වෙන දිශා ඔස්සේ වස්තුවක් මත ක්‍රියා කරයි. වස්තුව මත සම්ප්‍රයුක්ත බලය හා එය චලිත වන දිශාව වන්නේ,




(1) $5\sqrt{3}\ N$, $\overrightarrow{BD}$ දිශාවට. (2) $5\sqrt{3}\ N$, $\overrightarrow{BF}$ දිශාවට.
(3) $5\ N$, $\overrightarrow{BE}$ දිශාවට. (4) $5\ N$, $\overrightarrow{BF}$ දිශාවට.
(5) $2.5\ N$, $\overrightarrow{BE}$ දිශාවට.

6. ධ්වනිමාන කම්බියක එක් කෙළවරක් සුමට කප්පියක් වටා යවා එහි 1.6 $kg$ ස්කන්ධයක් එල්ලූ විට, සේතු අතර පරතරය 20 $cm$ වන අවස්ථාවේ සරසුලක් සමඟ අනුනාද විය. 1.6 $kg$ ඉවත් කර $M$ $kg$ ස්කන්ධයක් යොදා එම සරසුල සමඟම අනුනාද කල විට 25 $cm$ දී අනුනාදය ලැබුනි. $M$ හි අගය වන්නේ,

(1) 12.8 $kg$ (2) 2.5 $kg$ (3) 2.4 $kg$ (4) 2.0 $kg$ (5) 1.8 $kg$

7. ගලා යන දුස්ස්‍රාවී තරලයක ස්තර දෙකක් අතර ක්‍රියා කරන දුස්ස්‍රාවී ඝර්ෂණ බලය රඳා පවතින සාධක වන්නේ,
(A) ද්‍රව ස්තර අතර සඵල වර්ගඵලයයි.
(B) ද්‍රව ස්තර අතර පීඩන අන්තරයයි.
(C) ද්‍රව ස්තර අතර ප්‍රවේග අනුක්‍රමණයයි.

ඉහත ප්‍රකාශ අතුරින් නිවැරදි වන්නේ,

(1) $(A)$ පමණි. (2) $(A)$ හා $(B)$ පමණි. (3) $(B)$ හා $(C)$ පමණි.
(4) $(A)$ හා $(C)$ පමණි. (5) $(A)$, $(B)$ හා $(C)$ සියල්ලම.

8. $P$ හා $Q$ තිරස් පොළොව මත සම මට්ටමේ ඇති ස්ථාන දෙකකි. $P$ හි දී තිරසට 30° කෝණයකින් ආනතව $A$ වස්තුවක් ප්‍රක්ෂේපණය කරන මොහොතේ ම $Q$ සිට සිරස්ව ඉහලට $v$ ප්‍රවේගයෙන් $B$ වස්තුව ප්‍රක්ෂේපණය කරයි. $A$ හා $B$ ගැටේ නම්, $A$ ප්‍රක්ෂේපණය කල ප්‍රවේගය වන්නේ,




(1) $4v$ (2) $3v$ (3) $2v$
(4) $\sqrt{2}v$ (5) $v$

9. පෘෂ්ඨයේ උෂ්ණත්වය 6000 $K$ වන සූර්යයා තරංග ආයාමය 0.5 $\mu m$ වන සූර්ය විකිරණ උපරිම තීව්‍රතාවෙන් විමෝචනය කරයි. සර්වසම විමෝචක ගුණ දක්වන සූත්‍රිකා බල්බයකින් 2 $\mu m$ තරංග ආයාමය සහිත විකිරණ උපරිම තීව්‍රතාවෙන් විමෝචනය වේ නම් සූත්‍රිකාවේ උෂ්ණත්වය වන්නේ,
(1) 24000 $K$ (2) 6000 $K$ (3) 3000 $K$ (4) 2000 $K$ (5) 1500 $K$

10. $${}^{27}_{13}Al + {}^{1}_{0}n \rightarrow {}^{24}_{11}Na + x$$
ඉහත න්‍යෂ්ටික විමෝචන ක්‍රියාවලියේ දී විමෝචනය වන $x$ යනු,
(1) $\alpha$ අංශුවකි (2) $\beta$ අංශුවකි (3) ඉලෙක්ට්‍රෝනයකි
(4) ප්‍රෝටෝනයකි (5) නියුට්‍රිනෝවකි

**11.** වර්තන අංකය $\sqrt{2}$ ක් වූ වීදුරුවලින් තනා ඇති වාතයේ තබා ඇති සමපාද ප්‍රිස්මයක් තුලින් ගමන් කරන ආලෝක කිරණයක ගමන් මඟ නිවැරදිව දක්වන රූපය තෝරන්න.

(1)




(2)




(3)



(4)




(5)




**12.** ස්කන්ධය 0.4 $kg$ වූ වස්තුවක විස්ථාපන කාල වක්‍රය රූපයේ දැක්වේ. වස්තුව මත ඇති වන ආවේගී බලයේ විශාලත්වය,




(1) 1.6 $Ns$ (2) 0.8 $Ns$ (3) 0.4 $Ns$
(4) 0.2 $Ns$ (5) ශුන්‍යයි

**13.** ප්‍රදීපාගාරයක සිට 5.0 KHz සංඛ්‍යාතයකින් සයිරන් නළාවක් නාද කරයි. ප්‍රදීපාගාරය දෙසට පැමිණෙන $A$ නම් බෝට්ටුවකට එම හඬ 5.5 $KHz$ සංඛ්‍යාතයකින් ද, වෙනත් දිශාවකින් පැමිණෙන $B$ නම් බෝට්ටුවකට එම හඬ 6.0 $KHz$ සංඛ්‍යාතයකින් ද ශ්‍රවණය වෙයි. $A$ සහ $B$ හි ප්‍රවේග පිළිවෙලින් $v_A$ සහ $v_B$ නම් $\frac{v_A}{v_B}$ අනුපාතය වන්නේ,

(1) $\frac{1}{2}$ (2) $\frac{4}{3}$ (3) $\frac{12}{11}$ (4) $\frac{11}{6}$ (5) $\frac{6}{5}$

**14.** ආලෝක තරංගයක් $X$ මාධ්‍යයක් හරහා ගමන් කරන අයුරු රූපයේ දැක්වේ. $X$ මාධ්‍යයේ වර්තන අංකය වන්නේ,




(1) $\frac{5}{4}$ (2) $\frac{4}{3}$ (3) $\frac{3}{2}$ (4) $\frac{7}{4}$ (5) $\frac{8}{5}$

**15.** ස්වභාවධර්මයේ අන්තර් ක්‍රියා සිදු වන මූලික බල අතුරින් දුබල න්‍යෂ්ටික බලය සම්බන්ධ සංසිද්ධියක් වන්නේ,

(1) විකිරණශීලී න්‍යෂ්ටියකින් $\beta$ අංශු ක්ෂය වීමයි.
(2) පරමාණු න්‍යෂ්ටිය තුල නියුක්ලියෝන වල පැවැත්මයි.
(3) නිශ්චල ආරෝපණ අවට ස්ථිති විද්‍යුත් බල ඇතිවීමයි.
(4) චලනය වන ආරෝපණ වටා චුම්බක බල ක්ෂේත්‍ර ඇති වීමයි.
(5) පරමාණුවක න්‍යෂ්ටිය වටා ඉලෙක්ට්‍රෝනවල පැවැත්මයි.

**16.** කුඩාම මිනුම $0.1\ mm$ වන ව'නියර කැලිපරයක ව'නියර පරිමාණයේ (V) කොටස් 20ක් ප්‍රධාන පරිමාණයේ (M) කොටස් 19ක් සමඟ සමපාත වේ. මෙම කැලිපරයෙන් මිණුමක් ලබා ගත් අවස්ථාවක ප්‍රධාන හා ව'නියර පරිමාණ වල පිහිටීම රූපයේ දැක්වේ. මෙහි දැක්වෙන මිණුම වන්නේ,




(1) $5.212\ cm$ (2) $5.32\ cm$ (3) $5.412\ cm$ (4) $5.52\ cm$ (5) $6.32 cm$

**17.** විෂ්කම්භය $1.002\ m$ වූ ඇවමය රෝදයක පරිධිය වටා $30\ °C$ උෂ්ණත්වයේ දී විෂ්කම්භය $1.000\ m$ වූ රිම් එකක් සවි කිරීමට අවශ්‍යය. යකඩ සඳහා රේඛීය ප්‍රසාරණතාව $1.25 \times 10^{-5}\ °C$ වේ. යකඩ රිම් එක රත් කල යුතු උෂ්ණත්වය වන්නේ,

(1) $160\ °C$ (2) $190\ °C$ (3) $130\ °C$ (4) $463\ °C$ (5) $200\ °C$

**18.** ඇතුළත කුහරයක් සහිත ඝන සිලින්ඩරාකාර වස්තුවක් අක්ෂය සිරස්ව සිටින සේ $S$ දුනු තරාදියකින් එල්ලා $A$ සිට ජලය පිරවූ ටැංකියක් පතුලේ වූ $B$ දක්වා සීරුවෙන් පහත් කරනු ලැබේ. සිලින්ඩරය ජලය තුල ඉපිලීමකින් තොරව ගිල්විය හැකිය. සිලින්ඩරයේ පතුල ගමන් කරන $x$ දුර සමඟ දුනු තරාදියේ පාඨාංකය වෙනස්වන ආකාරය නිවැරදිව දැක්වෙන ප්‍රස්තාරය තෝරන්න. ($H > h$ වේ.)





(1)


(2)


(3)


(4)


(5)

**19.** $A$ හා $B$ වස්තු දෙකක් සරල රේඛීය මාර්ගයක එකිනෙකට දුරින් ඒකාකාර ප්‍රවේග සහිතව චලනය වෙමින් පවතී. $A$ හා $B$ හි ප්‍රවේග වල දිශාව එකිනෙකට ප්‍රතිවිරුද්ධ වන විට ඒවා සෑම තත්පරයක දීම $4\ m$ දුරකින් එකිනෙකට ලඟා වේ. ඒවායේ ප්‍රවේග එකම දිශාවට ඇති විට සෑම තත්පරයක දීම $0.4\ m$ දුරකින් එකිනෙකට ලඟා වේ. $A$ හි ප්‍රවේගය $B$ හි ප්‍රවේගයට වඩා විශාල නම්, $A$ හා $B$ හි ප්‍රවේග වන්නේ,

(1) $4.4\ ms^{-1}, 3.6\ ms^{-1}$ (2) $2.2\ ms^{-1}, 1.8\ ms^{-1}$ (3) $4\ ms^{-1}, 0.4\ ms^{-1}$
(4) $2\ ms^{-1}, 0.2\ ms^{-1}$ (5) $2.2\ ms^{-1}, 0.4\ ms^{-1}$

**20.** සක්‍රියතාව $2 \times 10^{-3}\ Bq$ වූ $S_1$ විකිරණශීලී සාම්පලයක ඇති න්‍යෂ්ටි සංඛ්‍යාව, සක්‍රියතාව $4 \times 10^{-3}\ Bq$ වූ $S_2$ විකිරණශීලී සාම්පලයක න්‍යෂ්ටි ගණන මෙන් දෙගුණයකි. $S_1$හි ආයු කාලය වසර 4ක් නම් $S_2$හි ආයු කාලය,

(1) අවු. 1 (2) අවු. 2 (3) අවු. 4 (4) අවු. 8 (5) අවු. 16

**21.** පෘථිවි පෘෂ්ඨය මත දී සරල අවලම්බයක දෝලන කාලය $T_1$ වේ. පෘථිවි පෘෂ්ඨයේ සිට පෘථිවි අරය වූ $R$ ට සමාන උසකින් වූ ස්ථානයක දී එම සරල අවලම්බයේ දෝලන කාලය $T_2$ නම් $T_2/T_1$ හි අගය,

(1) 1 (2) 2 (3) $\sqrt{2}$ (4) 4 (5) $2\sqrt{2}$

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

**22.** වර්තන අංකය $2/\sqrt{3}$ වන ද්‍රව්‍යයකින් සෑදි ඝන සිලින්ඩරයක එක් කෙළවරක මුහුණතේ කේන්ද්‍රය මත $\theta$ පතන කෝණයකින් පතනය වන ආලෝක කිරණක් වර්තනයෙන් පසු නැවත වාතයට නිර්ගමනය නොවී සිලින්ඩරයේ බිත්තිය දිගේ ගමන් කරයි. $\sin\theta$ හි අගය වන්නේ,




(1) $\frac{1}{2\sqrt{3}}$ (2) $\frac{1}{\sqrt{3}}$ (3) $\frac{\sqrt{3}}{2}$ (4) $\frac{1}{\sqrt{2}}$ (5) $\frac{1}{2}$

**23.** ස්කන්ධය පිළිවෙලින් $m$ හා $2m$ වන $P$ හා $Q$ කුට්ටි දෙකක් සැහැල්ලු දුනු තරාදියකින් සම්බන්ධ කර පද්ධතිය සුමට තිරස් පෘෂ්ඨයක් මත තබා ඇත. $F_1$ හා $F_2$ යන තිරස් බල දෙකක් $(F_1 > F_2)$ පිළිවෙලින් $P$ හා $Q$ මත යෙදෙන අතර පද්ධතිය ඒකාකාර ත්වරණයකින් වම් දිශාවට චලනය වේ. දුනු තරාදියේ පාඨාංකය වන්නේ,




(1) $\frac{2F_1-F_2}{3}$ (2) $\frac{2(F_1-F_2)}{3}$ (3) $\frac{2F_1+F_2}{3}$ (4) $\frac{F_1+2F_2}{3}$ (5) $\frac{F_1-F_2}{3}$

**24.** කම්බියක් $1\,mm$ කින් දිග වැඩි වන සේ ඇදීමේ දී $2\,J$ කාර්යයක් සිදු වේ. හරස්කඩ විෂ්කම්භය ඉහත කම්බිය මෙන් දෙගුණයක් සහ දිග ඉන් අඩක් වූ එම ද්‍රව්‍යයෙන් ම සෑදි වෙනත් කම්බියක් $1\,mm$ කින් ඇදීමේ දී කෙරෙන කාර්යය වන්නේ,

(1) $0.25\,J$ (2) $2\,J$ (3) $4\,J$ (4) $8\,J$ (5) $16\,J$

**25.** ස්කන්ධය $M$ හා අරය $R$ වූ රෝදයක් ලිස්සීමකින් තොරව තිරස් මාර්ගයක් ඔස්සේ පෙරලෙමින් ඉදිරියට යයි. එහි භ්‍රමණ චාලක ශක්තිය එහි මුළු චාලක ශක්තියෙන් 40% කි. එහි අවස්ථිති ඝූර්ණය වන්නේ,

(1) $\frac{2}{5}MR^2$ (2) $\frac{2}{3}MR^2$ (3) $\frac{3}{5}MR^2$ (4) $\frac{1}{3}MR^2$ (5) $\frac{1}{2}MR^2$

**26.** සැහැල්ලු අවිතන්‍ය තන්තුවකින් එල්වා ඇති පින්තූරයක් රූපයේ දැක්වේ. තන්තුවේ ආතතිය $(T)$, $\theta$ කෝණය සමඟ වෙනස් වන ආකාරය නිවැරදිව දැක්වෙන ප්‍රස්තාරය තෝරන්න.




(1)




(2)




(3)




(4)




(5)




iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

**27.** අරය $a$ වන සුමට වළල්ලකට $P$ පබළුවක් අමුණා ඇත. වළල්ල එහි සිරස් විෂ්කම්භය හරහා යන අක්ෂයක් වටා $\omega$ කෝණික ප්‍රවේගයෙන් භ්‍රමණය කරයි. එවිට පබළුව වළල්ලට සාපේක්ෂව රූපයේ දැක්වෙන ස්ථානයේ නිශ්චලතාවේ පවතී. $\omega^2$ සමාන වන්නේ,




(1) $\frac{2a}{\sqrt{3}g}$ (2) $\frac{2g}{\sqrt{3}a}$ (3) $\frac{2g}{a}$ (4) $\frac{\sqrt{3}g}{a}$ (5) $\frac{\sqrt{3}a}{2g}$

**28.** තර්ක ද්වාර පරිපථයක් හා එහි $A$ හා $B$ ප්‍රදාන සඳහා ලබා දුන් වෝල්ටීයතා සංඥා




රූපයේ දැක්වේ.

ප්‍රතිදානය සඳහා ලැබෙන සංඥාව වන්නේ,

(1)



(2)



(3)



(4)



(5)



**29.** ධාරා ලාභය $\beta$ වූ ට්‍රාන්සිස්ටරයක් භාවිතා වන වර්ධක පරිපථයක් සම්බන්ධව පහත ප්‍රකාශ සලකන්න.

(A) සංග්‍රාහක ධාරාව $I_c = \beta I_b$ සම්බන්ධතාව තෘප්ත කරයි.

(B) ට්‍රාන්සිස්ටරය සංතෘප්ත කලාපයේ ක්‍රියා කරයි.

(C) $V_C = \frac{V_{CC}}{2}$ වන සේ $R_C$ තෝරා ගත යුතු ය.

මින් සත්‍ය වන්නේ,

(1) (A) පමණි (2) (A) හා (B) පමණි (3) (B) හා (C) පමණි
(4) (A) හා (C) පමණි (5) (A), (B) හා (C) සියල්ල

**30.** ස්කන්ධය $m$ හා ආරෝපණය $q$ වූ අංශුවක් චුම්බක ස්‍රාව ඝනත්වය $B$ වූ ඒකාකාර චුම්බක ක්ෂේත්‍රයක් සහිත ප්‍රදේශයකට රූපයේ පරිදි $\theta$ කෝණයකින් ආනතව $v$ වේගයෙන් $E$ හිදී ඇතුළු වී $F$ හිදී චුම්බක ක්ෂේත්‍රයෙන් පිට වේ. $E$ හා $F$ අතර දුර වන්නේ,




(1) $\frac{mv^2 \cos\theta}{Bq}$ (2) $\frac{mv^2 \sin\theta}{Bq}$ (3) $\frac{2mv\cos\theta}{Bq}$
(4) $\frac{2mv\sin\theta}{Bq}$ (5) $\frac{2m\sin\theta}{Bqv}$

**31.** ඝනත්වය $\rho$ හා පෘෂ්ඨික ආතතිය $T$ වූ ද්‍රවයක අරය $a$ වූ කුඩා ද්‍රව බිඳිති විශාල සංඛ්‍යාවක් එක් වී අරය $b$ වූ තනි විශාල ද්‍රව බිඳුවක් සෑදේ. මෙහිදී නිදහස් වන ශක්තිය විශාල ද්‍රව බිඳුවේ චාලක ශක්තිය බවට සම්පූර්ණයෙන් පරිවර්තනය වූයේ නම් විශාල ද්‍රව බිඳුවේ වේගය වන්නේ,

(1) $\sqrt{\frac{T}{\rho}\left(\frac{1}{a}-\frac{1}{b}\right)}$ (2) $\sqrt{\frac{2T}{\rho}\left(\frac{1}{a}-\frac{1}{b}\right)}$ (3) $\sqrt{\frac{3T}{\rho}\left(\frac{1}{a}-\frac{1}{b}\right)}$ (4) $\sqrt{\frac{6T}{\rho}\left(\frac{1}{a}-\frac{1}{b}\right)}$ (5) $\sqrt{\frac{8T}{\rho}\left(\frac{1}{a}-\frac{1}{b}\right)}$

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

**32.** සංවෘත බඳුනක ඇති අචල වායු ස්කන්ධයක් සඳහා $PV$ වක්‍රය රූපයේ දැක්වේ. මෙම පද්ධතියේ උෂ්ණත්වය පරිමාව සමඟ වෙනස් වන ආකාරය නිවැරදිව දක්වන ප්‍රස්තාරය තෝරන්න.




(1)



(2)



(3)



(4)



(5)



**33.** තාප සන්නායකතාව අඩු $XY$ කොටසක් සහිත පරිවරණය කරන ලද $PQ$ ලෝහ දණ්ඩ රූපයේ දැක්වේ. $P$ හා $Q$ දෙකෙළවර වෙනස් උෂ්ණත්ව දෙකක පවත්වා ගනු ලැබේ. අනවරත අවස්ථාවේ $X$ හා $Y$ අතර උෂ්ණත්ව වෙනස කෙරෙහි බලපෑමක් ඇති නොකරන්නේ,




(1) $P$ හා $Q$ අතර උෂ්ණත්ව වෙනස ය.
(2) ලෝහ දණ්ඩ තනා ඇති ද්‍රව්‍යයි
(3) $XY$ තනා ඇති ද්‍රව්‍යයි.
(4) $XY$ අතර දිගයි.
(5) $P$ සිට $XY$ කොටසට ඇති දුරයි.

**34.** සුමට තිරස් බිමක ආරම්භයේ දී නිශ්චලතාවේ ඇති ස්කන්ධය $2\ kg$ වූ වස්තුවක් මත ප්‍රස්තාරයේ දැක්වෙන පරිදි කාලයත් සමඟ වෙනස් වන තිරස් බලයක් යොදනු ලැබේ. තත්පර 6 අවසානයේ දී වස්තුව සතු චාලක ශක්තිය වන්නේ,




(1) $9\ J$ (2) $27\ J$ (3) $20.25\ J$ (4) $40.5\ J$ (5) $182.25\ J$

**35.** කඩදාසියේ තලය ඔස්සේ වූ චුම්බක ස්‍රාව ඝනත්වය $0.2\ T$ වූ චුම්බක ක්ෂේත්‍රයක් තුල රූපයේ දැක්වෙන පරිදි $5\ A$ ධාරාවක් ගලා යන සැහැල්ලු සන්නායක කම්බියක් තබා ඇත. කම්බිය මත ක්‍රියා කරන සම්ප්‍රයුක්ත බලය වන්නේ,




(1) $0.40\ N$ (2) $0.32\ N$ (3) $0.20\ N$
(4) $0.16\ N$ (5) $0.12\ N$

**36.** පොටවල් 100 ක් සහිත $3\ cm \times 4\ cm$ සෘජුකෝණාස්‍රාකාර කම්බි දඟරයක් $z$ අක්ෂය ඔස්සේ රූපයේ පරිදි අසව් කර ඇත. චුම්බක ස්‍රාව ඝණත්වය $1\,T$ වූ චුම්බක ක්ෂේත්‍රයක් $y$ අක්ෂයේ දිශාවට ලබා දී දඟරය ඔස්සේ $2\,A$ ධාරාවක් යවනු ලැබේ. දඟරය $x$ අක්ෂයට $37°$ කෝණයකින් ආනතව පවතින අවස්ථාවේ දඟරය මත ක්‍රියා කරන ව්‍යාවර්තය කුමක් ද? $(\sin 37 = 0.6, \cos 37 = 0.8)$




(1) $0.144\ Nm$ (2) $0.180\ Nm$ (3) $0.192\ Nm$

(4) $0.240\ Nm$ (5) $0.280\ Nm$

**37.** සංතෘප්ත වාෂ්ප ඝනත්වය $25\ °C$ දී $23\ g/m^3$ ද, $27\ °C$ දී $26\ g/m^3$ ද වේ. පරිමාව $100\ cm^3$ ක් වූ කාමරයක උෂ්ණත්වය $25°$ දී සාපේක්ෂ ආර්ද්‍රතාවය 60% විය. කාමරය තුල ජල බඳුනක් තබා යම් කාලයකට පසු කාමරයේ සාපේක්ෂ ආර්ද්‍රතාවය 100% වී තිබූ අතර මෙ අවස්ථාවේ උෂ්ණත්වය $27°$ විය. ජල බඳුනෙන් අඩු වූ ජල ස්කන්ධය වන්නේ,

(1) $920\ g$ (2) $1380\ g$ (3) $1680\ g$ (4) $2600\ g$ (5) $1220\ g$

**38.** $A$ හා $B$ අතර සමක ප්‍රතිරෝධය වන්නේ,




(1) $6\ \Omega$ (2) $4\ \Omega$ (3) $\frac{40}{9}\ \Omega$

(4) $\frac{9}{4}\ \Omega$ (5) $\frac{4}{9}\ \Omega$

**39.** විභව මානයක් භාවිතයෙන් කෝෂයක වි.ගා.බ. සෙවීමේ පරීක්ෂණයක ඇටවුම පහත දැක්වේ.
මෙහි දී සෑම විටම ගැල්වනෝමීටරය එකම දිශාවට උත්ක්‍රමණය වන බව නිරීක්ෂණය විය. පරිපථයේ තිබිය හැකි දෝෂය පිළිබඳ පහත ප්‍රකාශ සලකන්න.




(A) $E_1$ කෝෂයේ වි.ගා.බ. $AB$ අතර විභව අන්තරයට වඩා කුඩා විය හැකිය.

(B) ද්විතියික පරිපථය $A$ හිදී විසන්ධි වී තිබිය හැකිය.

(C) $E_1$ හා $E_0$ ප්‍රතිවිරුද්ධ දිශාවලට මුහුණලා සම්බන්ධ කර තිබිය හැකිය.

මින් නිවැරදි වන්නේ,

(1) (A) පමණි. (2) (A) හා (B) පමණි. (3) (B) හා (C) පමණි.

(4) (A) හා (C) පමණි. (5) (A), (B) හා (C) සියල්ල.

**40.** අනන්ත දිගැති සන්නායක කම්බියක මධ්‍ය අරය $R$ වූ අර්ධ වෘතාකාර කොටසක් සෑදෙන සේ නමා ඇත. අර්ධ වෘතාකාර කොටස සිරස්ව පිහිටන ලෙස ද, එහි තලයට ලම්බක වන සේ නැමූ දිගු සෘජු සමාන්තර කම්බි කොටස් තිරස් තලය මත පිහිටන ලෙස ද එය රඳවා කම්බිය දිගේ $I$ ධාරාවක් යවන ලදී. කේන්ද්‍රයේ ඇති වන සම්ප්‍රයුක්ත චුම්බක ස්‍රාව ඝනත්වය වන්නේ,




(1) $\frac{\mu_0 I}{4R}\left[1+\frac{2}{\pi}\right]$ (2) $\frac{\mu_0 I}{4e}\left[1+\frac{2}{\pi}\right]$ (3) $\frac{\mu_0 I}{4R}\left[1+\frac{4}{\pi}\right]$

(4) $\frac{\mu_0 I}{4R}\sqrt{1+\frac{4}{\pi^2}}$ (5) $\frac{\mu_0 I}{2R}\sqrt{1+\frac{4}{\pi^2}}$.

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

**41.** මෙම පරිපථයේ කෝෂයේ ප්‍රතිදාන ක්ෂමතාව උපරිම වන්නේ $R$ හි කුමන අගයක් සඳහා ද?




(1) $2\,\Omega$ (2) $4\,\Omega$ (3) $6\,\Omega$
(4) $8\,\Omega$ (5) ශුන්‍ය.

**42.** එක්තරා ද්‍රවයක $5\,kg$ ක් සහිත කුඩා තටාකයක් තුල ආලෝක ක්ෂමතාව 40% ක් වූ ක්ෂමතාව $100\,W$ වන විදුලි බුබුලු දෙකක් දල්වා ඇත. තටාකයේ බිත්ති වල තාප ධාරිතාව නොසලකා හල හැකි අතර පරිසරයට තාප හානි වීමේ සීඝ්‍රතාව $5\,W$ වේ. ද්‍රවයේ උෂ්ණත්වය මිනිත්තු 5 කදී $25\,°C$ සිට $30\,°C$ දක්වා ඉහල නගීනම් ද්‍රවයේ විශිෂ්ට තාප ධාරිතාව වන්නේ,

(1) $1380\,Jkg^{-1}°C^{-1}$ (2) $660\,Jkg^{-1}°C^{-1}$ (3) $900\,Jkg^{-1}°C^{-1}$
(4) $1439.8\,Jkg^{-1}°C^{-1}$ (5) $1500\,Jkg^{-1}°C^{-1}$

**43.** අනුනාද නලයක එක් කෙළවරක් විවෘතව ඇති අතර අනෙක් කෙළවර වසා හෝ විවෘතව භාවිතා කල හැකිය. මේ ඕනෑම ආකාරයකට එහි වායු කඳේ අවම අනුනාද සංඛ්‍යාතය $150\,Hz$ විය. මෙම වායු කඳේ ස්වාභාවික සංඛ්‍යාතයක් නොවන්නේ,

(1) $300\,Hz$ (2) $450\,Hz$ (3) $750\,Hz$ (4) $800\,Hz$ (5) $1050\,Hz$

**44.** පහත පරිපථයේ $D$ මගින් $Si$ ඩයෝඩයක් දැක්වේ. $A$ හි විභවය වන්නේ,




(1) $0\,V$ (2) $-5\,V$ (3) $-4.3\,V$ (4) $-2.5\,V$ (5) $0.7\,V$

**45.** සෘජුකෝණාස්‍ර කාර පුඩුවක් සෑදෙන පරිදි $R$ ප්‍රතිරෝධක දෙකක් දිගු සන්නායක පීලි දෙකකින් සම්බන්ධ කර ඇත. පීලි දෙක මත රූපයේ පරිදි $l$ දිගැති ප්‍රතිරෝධය $R$ වූ $PQ$ සන්නායකයක් තබා එය $v$ වේගයෙන් චලනය කරවයි. පරිපථ ඇටවුම චුම්බක ස්‍රාව ඝනත්වය $B$ වන කඩදාසිය තුලට පවතින ඒකාකාර චුම්බක ක්ෂේත්‍රයක් තුල තබා ඇත්නම් $PQ$ ඔස්සේ ගලා යන ධාරාව $(I)$ වන්නේ,




(1) $\frac{Blv}{3R}$ (2) $\frac{Blv}{2R}$ (3) $\frac{Blv}{R}$ (4) $\frac{2Blv}{3R}$ (5) $\frac{2Blv}{R}$

**46.** එකිනෙකට $d$ පරතරයකින් සිරස්ව තැබූ දිගු $L$ හා $M$ සමාන්තර තහඩු දෙකක් අතර $V$ විභව අන්තරයක් පවතී. ස්කන්ධය $m$ වූ $+q$ ආරෝපිත අංශුවක් $L, M$ අතර මධ්‍යයේ ඉහළින්ම වූ $P$ හි සිට නිශ්චලතාවෙන් මුදා හරියි. අංශුව තහඩුවේ ගැටෙන්නේ $X$ සිට කොපමණ සිරස් දුරකින් ද?




(1) $\frac{mgd^2}{2Vq}$ (2) $\frac{mgd}{2Vq}$ (3) $\sqrt{\frac{mgd}{2Vq}}$ (4) $\sqrt{\frac{md^2}{Vq}}$ (5) $\frac{mg}{2Vq}$

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

**47.** සවිධි කුහර චතුස්තලයක් (මුහුණත් 4ක් සහිත ) තුල $^{4}_{2}He$ අයන 4ක් ඇත. චතුස්තලයෙන් පිටත පොසිට්‍රෝන ($^{+}\beta$) 8ක් ඇත. මාධ්‍යයේ පාරවේද්‍යතාව $\varepsilon$ හා ඉලෙක්ට්‍රෝනයක ආරෝපණයේ විශාලත්වය $e$ වේ. චතුස්තලයේ එක් මුහුණතක් හරහා ගමන් කරන සඵල විද්‍යුත් ප්‍රාවය වන්නේ,

(1) $\frac{+14e}{\varepsilon}$ (2) $\frac{+10e}{\varepsilon}$ (3) $\frac{+8e}{\varepsilon}$ (4) $\frac{+4e}{\varepsilon}$ (5) $\frac{+2e}{\varepsilon}$

**48.** විශිෂ්ට තාප ධාරිතාව $445\,Jkg^{-1}K^{-1}$ වන වානේ වලින් සෑදූ $1\,kg$ ස්කන්ධය සහිත අශ්ව ලාඩමක් සෑදීමේ දී කම්මල්කරු 1100 °C ට රත් කරන ලද අශ්ව ලාඩම 20 °C හි ඇති ජලය $1\,kg$ සහිත බඳුනකට දමයි. ජලයේ වාෂ්පීකරණයේ විශිෂ්ට ගුප්ත තාපය $2.25 \times 10^{5}\,Jkg^{-1}$ , ජලයේ විශිෂ්ට තාප ධාරිතාව $4200\,Jkg^{-1}K^{-1}$ හා බඳුනේ තාප ධාරිතාව $800\,J°C^{-1}$ වේ. පරිසරයට සිදු වන තාප හානි නොසලකා හල හැකි නම් හුමාලය බවට පත් වන ජල ස්කන්ධය වන්නේ,

(1) $200\,g$ (2) $480\,g$ (3) $1978\,g$ (4) $682\,g$ (5) $150\,g$

**49.** රූපයේ දැක්වෙන පරිපථයේ කෝෂ දෙකෙහි අභ්‍යන්තර ප්‍රතිරෝධ $r_1$ හා $r_2$ වේ. $r_1$ අභ්‍යන්තර ප්‍රතිරෝධය සහිත කෝෂය හරහා සම්බන්ධ කල විට පරිපූර්ණ වෝල්ට් මීටරයේ පාඨාංකය ශුන්‍ය වේ නම් පහත ඒවායින් නිවැරදි සබඳතාව වන්නේ,




(1) $8 = r_1 + r_2$ (2) $8 = \frac{r_1 r_2}{r_1 + r_2}$ (3) $8 = r_1 - r_2$

(4) $8 = r_2 - r_1$ (5) $8 = \frac{r_1}{r_2}$

**50.** පොළොවේ සිට $h$ උසකින් ඇති සඵල වර්ගඵලය $A$ වූ ආරෝපිත වලාකුළක සිට පොළොවට පතිත වන අකුණක් $t$ කාලයක් තුල දී $I$ ධාරාවක් ඇති කරයි. වලාකුළ හා පොළොව සහිත පද්ධතිය සමාන්තර තහඩු ධාරිත්‍රකයක් ලෙස සැලකිය හැකිය. වාතයේ පාරවේද්‍යතාව $\varepsilon_0$ වේ. අකුණ පතිත වීමට මොහොතකට පෙර වලාකුළ හා පොළොව අතර ඇතිවෙන විද්‍යුත් ක්ෂේත්‍ර තීව්‍රතාවේ විශාලත්වය වන්නේ,




(1) $\frac{Ith}{A\varepsilon}$ (2) $\frac{It}{A\varepsilon}$ (3) $\frac{It}{A\varepsilon h}$ (4) $\frac{ItA\varepsilon}{h^2}$ (5) $\frac{A\varepsilon}{Ith^2}$

* * *

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education Westerns Province

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
General Certificate of Education (Adv. Level) Examination, 2025
අවසාන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය

**භෞතික විද්‍යාව II**
**Physics II**

**01 S II**

පැය තුනයි
Three Hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

විභාග අංකය : ..........................................................................

වැදගත් :

* මෙම ප්‍රශ්න පත්‍රය පිටු 16 යුක්ත වේ.
* මෙම ප්‍රශ්න පත්‍රය A සහ B යන කොටස් **දෙකකින්** යුක්ත වේ. **කොටස් දෙකට ම** නියමිත කාලය **පැය තුනකි.**
* ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු **නො ලැබේ.**

**A කොටස - ව්‍යුහගත රචනා**
(පිටු 2 – 8)

**සියලු ම** ප්‍රශ්න වලට පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න. ඔබේ පිළිතුරු, ප්‍රශ්න පත්‍රයේ ඉඩ සලසා ඇති තැන්වල ලිවිය යුතුය. මේ ඉඩ ප්‍රමාණය පිළිතුරු ලිවීමට ප්‍රමාණවත් බවද සලකන්න.

**B කොටස - රචනා**
(පිටු 9 – 16)

මෙම කොටස ප්‍රශ්න **හයකින්** සමන්විත වන අතර ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සැපයිය යුතුය. මේ සඳහා සපයනු ලබන කඩදාසි පාවිච්චි කරන්න.

* සම්පූර්ණ ප්‍රශ්ණ පත්‍රයට නියමිත කාලය අවසන් වූ පසු A සහ B කොටස් **එක් පිළිතුරු පත්‍රයක්** වන සේ, A කොටස B කොටසට **උඩින්** තිබෙන පරිදි අමුණා, විභාග ශාලාධිපතිට භාර දෙන්න.
* ප්‍රශ්න පත්‍රයේ **B කොටස පමණක්** විභාග ශාලාවෙන් පිටතට ගෙන යාමට ඔබට අවසර ඇත.

**පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා පමණි**

දෙවැනි පත්‍රය සඳහා

| කොටස | ප්‍රශ්න අංකය | ලැබූ ලකුණු |
|---|---|---|
| A | 1 | |
| | 2 | |
| | 3 | |
| | 4 | |
| B | 5 | |
| | 6 | |
| | 7 | |
| | 8 | |
| | 9(A) | |
| | 9(B) | |
| | 10(A) | |
| | 10(B) | |
| එකතුව | ඉලක්කමෙන් | |
| | අකුරෙන් | |

සංකේත අංක

| | |
|---|---|
| උත්තර පත්‍ර පරීක්ෂක 1 | |
| උත්තර පත්‍ර පරීක්ෂක 2 | |
| ලකුණු පරීක්ෂා කළේ | |
| අධීක්ෂණය කළේ | |

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

**A – කොටස – ව්‍යුහගත රචනා**

**ප්‍රශ්න හතරටම පිළිතුරු මෙම පත්‍රයේම සපයන්නග**

$$g = 10Nkg^{-1}$$

01.

(a) $h$ උසකට ඝනත්වය $\rho$ ද්‍රවයක් පුරවා ඇති වීදුරු බීකරයක පතුල මත ඇති කරන පීඩනය සඳහා ප්‍රකාශනයක් ලියන්න (භාවිතා කරන අමතර සංකේත වේ නම් හඳුන්වන්න)

..........................................................................................................................................................

..........................................................................................................................................................

(b) එක්තරා පරීක්ෂණයකට පෙර වායු ගෝලීය පීඩනය $76\ Hgcm$ ලෙස දී ඇත්නම් ඉන් අදහස් වන්නේ කුමක්ද?

..........................................................................................................................................................

(c) එකිනෙක මිශ්‍ර නොවන ද්‍රව දෙකක ඝනත්ව සංසන්දනය කිරීම සඳහා $U$ නලයක් භාවිතා කරන ඇටවුමකින් අසම්පූර්ණ රූප සටහනක් පහත දක්වා ඇත ආරම්භයේදී නලයේ අඩක් පමණ ජලය පුරවා ජල කඳට ඉහළින් ද්‍රව කඳ වන පරිදි ද්‍රවය එක් බාහුවකින් එකතු කරනු ලැබේ



(i) ජල සහ ද්‍රව කඳන්හි පොදු අතුරු මුහුණත ද්‍රව මාවක පැහැදිලිව දැකගත හැකි පරිදි රූප සටහනේ ලකුණු කරන්න

(ii) ඇටවුම සඳහා භාවිතා කරන පාසල් විද්‍යාගාරයේ ඇති $U$ නලයේ හරස්කඩ විෂ්කම්භය කොපමණ වේද?

..........................................................................................

(iii) ප්‍රතිශත දෝෂය අවම කර ගැනීම සඳහා සාමාන්‍යයෙන් ද්‍රව කඳ පවත්වාගත යුතු අවම උස කොපමණද?

..........................................................................................

(iv) ද්‍රව කඳ එකතු කළ වහාම පාඨාංක ගැනීම සිදු නොකළ යුතුයි එයට හේතුව කුමක් ද?

..........................................................................................................................................

..........................................................................................................................................

(v) භාවිතා කරන ද්‍රවයේ සාපේක්ෂ ඝනත්වය සෙවීම සඳහා මෙම ඇටවුම භාවිතා කිරීමේ දී ඔබ ලබාගන්නා පාඨාංක තුනක් ලියා දක්වන්න

1) ............................................................................................... – $(x_1)$
2) ............................................................................................... – $(x_2)$
3) ............................................................................................... – $(x_3)$

(vi) පොදු අතුරු මුහුණතේදී ද්‍රව කඳ $(h_l)$ මගින් ඇති කරන පීඩනය $(P_l)$ සඳහා සහ ජල කඳ $(h_w)$ මගින් ඇති කරන පීඩනය $(P_w)$ සඳහා ප්‍රකාශන දෙකක් වෙන වෙනම ඉහත $(x_1, x_2, x_3)$ පාඨාංක ඇසුරෙන් ලියා දක්වන්න (ද්‍රවයේ ඝනත්වය $\rho_l$ ජලයේ ඝනත්වය $\rho_w$ ලෙස ගන්න)

1) ...........................................................................................................................

2) ...........................................................................................................................

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources
iexamhub

(vii) පරීක්ෂණය සිදු කිරීමෙන් අනතුරුව ශිෂ්‍යයකු ලබාගත් පාඨාංක ඇසුරෙන් අඳින ලද $h_l$ ඉදිරියෙන් $h_w$ ප්‍රස්ථාර ගත කර ඇති ආකාරය පහත දැක්වේ




1) දී ඇති තොරතුරු ඇසුරෙන් අනුක්‍රමණය ගණනය කරන්න

..................................................................................................................................................

..................................................................................................................................................

..................................................................................................................................................

2) ද්‍රවයේ සාපේක්ෂ ඝනත්වය ගණනය කරන්න (ජලයේ ඝනත්වය $1000\ kgm^{-3}$) වේ

..................................................................................................................................................

..................................................................................................................................................

..................................................................................................................................................

..................................................................................................................................................

(viii) ඝනත්ව සංසන්දනය කෙරෙන මෙවැනි පරීක්ෂණයක් සඳහා $U$ නලයක් භාවිතා කිරීමේ ඇති අවාසි දෙකක් සඳහන් කරන්න

1) ..................................................................................................................................................

..................................................................................................................................................

2) ..................................................................................................................................................

..................................................................................................................................................

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

02. නිව්ටන් සිසිලන නියමය භාවිතා කරමින් ජලයට වඩා අඩු තාප ධාරිතාවක් සහිත ද්‍රවයක විශිෂ්ට තාප ධාරිතාව සෙවීම සඳහා සකස් කරන ලද ඇටවුමක රූප සටහනක් පහත සටහනෙහි දැක්වේ



a) නිව්ටන්ගේ සිසිලන නියමය අනුව රත් වූ වස්තුවකින් තාපය හානි වීමේ සීඝ්‍රතාව රඳාපවතින සාධක තුනක් ලියා දක්වන්න

1) ........................................................................................

2) ........................................................................................

3) ........................................................................................

b) පරීක්ෂණය සිදු කිරීම සඳහා අත්‍යවශ්‍ය උපකරණයක් සහ අයිතමයක් ඉහත රූප සටහනෙහි ඇඳ නම් කරන්න

c) මෙම පරීක්ෂණය ද්‍රවයට සහ ජලයට වෙන වෙනම සිදු කළ යුතු බවත් අවස්ථා දෙකේදීම සමාන තත්ත්ව ලබාදිය යුතු බවත් ශිෂ්‍යයෙක් ප්‍රකාශ කරයි. එලෙස සමාන තත්ව ලබාදීමට විද්‍යාගාරය තුළ ඔබට සිදුකළ හැකි ක්‍රියාමාර්ග දෙකක් ලියන්න

1) ........................................................................................................................................

........................................................................................................................................

2) ........................................................................................................................................

........................................................................................................................................

d) පහත ප්‍රස්ථාර දළ සටහනෙහි දක්වා ඇත්තේ පරීක්ෂණයේ ප්‍රතිඵල අනුව ලබාගත් ජලය සඳහා වූ සිසිලන වක්‍රය වේ ඒ අනුව ද්‍රවය සඳහා විය හැකි සිසිලන වක්‍රයේ දළ හැඩය මෙම ප්‍රස්ථාරයෙහිම ඇඳ දක්වන්න




e) පහත දක්වා ඇති තොරතුරු භාවිතා කරමින්

හිස් කැලරි මීටරය සහ මන්ථයේ ස්කන්ධය
$= 10 \times 10^{-3} kg$

ජලය සහිත කැලරි මීටරය සහ මන්ථයේ ස්කන්ධය
$= 30 \times 10^{-3} kg$

ද්‍රවය සහිත කැලරි මීටරය සහ මන්ථයේ ස්කන්ධය
$= 26 \times 10^{-3} kg$

ජලයේ විශිෂ්ට තාප ධාරිතාව
$= 4.2 \times 10^{3} J kg^{-1} K^{-1}$

තඹ වල විශිෂ්ට තාප ධාරිතාව
$= 0.4 \times 10^{3} J kg^{-1} K^{-1}$



(i) ජලය සහිත කැලරිමීටරයේ තාප හානි වීමේ සීඝ්‍රතාවය ගණනය කරන්න

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

(ii) ඉහත සඳහන් පිළිතුරු ඇසුරෙන් ද්‍රවයේ විශිෂ්ට තාප ධාරිතාව ගණනය කරන්න

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

f) පරීක්ෂණය අවසානයේදී සිසු යෝජනා වශයෙන් පරීක්ෂණය සිදු කිරීම සඳහා තඹ කැලරි මීටරය වෙනුවට වීදුරු බීකරයක් හෝ තාප පරිවාරක ද්‍රව්‍යයකින් සෑදූ කෝප්පයක් යොදාගැනීමට යෝජනා විය එම බඳුන් භාවිතා කළ හැකි/නොහැකි බව දක්වා ඒ සඳහා හේතුව වගුවේ සඳහන් කරන්න

| | හැකි/නොහැකි බව | හේතුව |
|---|---|---|
| වීදුරු බීකරයක | | |
| තාප පරිවාරක ද්‍රව්‍යයකින් සෑදූ කෝප්පයක | | |

03. කෙළවරක් සංවෘත නළයක් තුළ ඇති වායු කඳන් කම්පනය වීමෙන් නලය තුළ ස්ථාවර තරංග නිර්මාණය වේ මෙලෙස ඇතිවන වාතයේ ධ්වනි තරංග වේගය $V = \sqrt{\frac{\gamma RT}{M}}$ මගින් ලබා දෙයි ($\gamma -$ වාතයේ විශිෂ්ට තාප ධාරිතා අතර අනුපාතය $R -$ සාර්වත්‍රය වායු නියතය $T -$ කාමර උෂ්ණත්වය $M -$ මවුලික ස්කන්ධය) විද්‍යාගාරයේදී චලනය කළ හැකි පිස්ටනයක් මගින් එක් කෙළවරක් සංවෘත කළ වීදුරු නලයක් සහ සරසුල් කට්ටලයක් භාවිතයෙන් වාතයේ විශිෂ්ට තාප ධාරිතා අතර අනුපාතය සෙවීමට පරීක්ෂණයක් ශිෂ්‍යයන් කණ්ඩායමක් සැලසුම් කර ඇත



a) නලය තුළින් මූලික තානයෙන් වායු කඳ කම්පනය වන විට ඇතිවන ස්ථාවර තරංග රටාව ඇඳ දක්වන්න ආන්ත දෝෂය $(e)$ පැහැදිලිව දක්වන්න

b) කම්පන දිග $l$ සහ තරංග ආයාමය $\lambda$ වන විට මූලික තානයේ කම්පනය වන තරංගයේ තරංග ආයාමය සඳහා ප්‍රකාශනයක් ලියා දක්වන්න

..............................................................................................................................................

c) ඉහත (b) හි ලබාගත් ප්‍රකාශනය ඇසුරෙන් වාතයේ ධ්වනි තරංග ප්‍රවේගය සඳහා ප්‍රකාශනයක් $l, e$ සහ මූලික සංඛ්‍යාතය $f$ ඇසුරෙන් ලියන්න

..............................................................................................................................................

d) වාතයේ ධ්වනි තරංග ප්‍රවේගය සඳහා ඉහත ලබාදී ඇති ප්‍රකාශනයත් (c) හි ප්‍රකාශනයත් ඇසුරෙන් $l$ සඳහා සමීකරණයක් ලබා ගන්න

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

e) ප්‍රස්ථාරික ක්‍රමයක් භාවිතා කරමින් වාතයේ විශිෂ්ට තාප ධාරිතා අතර අනුපාතය සෙවීමට හැකිවන පරිදි ඉහත සමීකරණය සකස් කරන්න

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

f) පහත වගුවේ ඇති පාඨාංක ඇසුරෙන් අක්ෂ නිවැරදිව නම් කර ප්‍රස්ථාරය ඇඳ දක්වන්න

| $\frac{1}{f} \times 10^{-3} (s)$ | 2.25 | 2.50 | 2.75 | 3.00 | 3.25 |
|---|---|---|---|---|---|
| $l\ (cm)$ | 18.50 | 20.50 | 22.75 | 24.75 | 27.00 |



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

g) අනුක්‍රමණය සෙවීම සඳහා පාඨාංක දෙකක් ලියා දක්වන්න (ප්‍රස්ථාරයේ ඊ හිස් මගින් එම ලක්ෂ දෙක දක්වන්න)

$A -$ (................. , .................)
$B -$ (................. , .................)

h) අනුක්‍රමණය ගණනය කරන්න

.....................................................................................................................................................
.....................................................................................................................................................
.....................................................................................................................................................

i) වාතයේ මවුලික ස්කන්ධය $30\ gmol^{-1}$ කාමර උෂ්ණත්වය $20℃$ සාර්වත්‍ර වායු නියතය $8.3mol^{-1}K^{-1}$ වේ නම් විශිෂ්ට තාප ධාරිතා අතර අනුපාතය ගණනය කරන්න

.....................................................................................................................................................
.....................................................................................................................................................
.....................................................................................................................................................
.....................................................................................................................................................
.....................................................................................................................................................
.....................................................................................................................................................

j) මෙවැනි පරීක්ෂණයකට අදාළව ඇඳි ප්‍රස්ථාරයක අන්තඃ ඛණ්ඩය ලෙස $(-\ 0.80\ cm)$ අගයක් ලැබී තිබුණි නම් ඉන් කුමන රාශියක අගය ලැබේද ?

.....................................................................................................................................................
.....................................................................................................................................................

04.

(a) වැරදි පිළිතුරු කපා හරින්න.




$E_0$ සඳහා (***වියළි කෝෂ / ඇකියුම්ලේටර්***) වඩා සුදුසු වේ. $S_1$ සඳහා (***ටකන / ජේනු***) යතුර භාවිතා කරයි. $R_1$ ප්‍රතිරෝධය සඳහා (**100Ω / 5kΩ**) වඩා සුදුසු වේ. $S_2$ දෙමං යතුරකි. සංතුලන ලක්ෂය ආසන්නයේදී $S_3$ (***විවෘත / සංවෘත***) කළ යුතුය.

(b) $E_1$ සඳහා සම්මත කෝෂයක් භාවිතා කල විට $E_2$ හි අගය ගණනය කරගත හැක.

1) සම්මත කෝෂයක තිබිය යුතු ලක්ෂණයක් ලියන්න.

.....................................................................................................................................................
.....................................................................................................................................................

2) විභවමාන නියතය $(K)$ සඳහා ප්‍රකාශනයක් $E_1$ හා සංතුලන දිග $l_1$ ඇසුරෙන් ලියන්න.

.....................................................................................................................................................
.....................................................................................................................................................

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

3) $E_2$ සඳහා සංතුලන දිග $l_2$ නම් $E_2$ හි අගය සඳහා ප්‍රකාශනයක් $E_1$ , $l_1$ සහ $l_2$ ඇසුරෙන් ලියන්න.

.....................................................................................................................................

.....................................................................................................................................

(c) $E_0$ වඩා විශාල වන විට පරීක්ෂණය සඳහා සිදුවන බලපෑම කුමක්ද?

.....................................................................................................................................

.....................................................................................................................................

(d) ධාරාව නොගලන විට $G$ හි දර්ශකය පවතින ආකාරය රූපයේ දක්වන්න.




(e) ඉහත පරීක්ෂණය සඳහා මෙම ගැල්වනෝමීටරය භාවිතා කල හැකිද? හේතු දක්වන්න.

.....................................................................................................................................

.....................................................................................................................................

(f) 1. ආන්ත දෝෂය යනු කුමක්ද?

.....................................................................................................................................

.....................................................................................................................................

2. $E_1$ සඳහා සංතුලන දිග $4cm$ ලෙස දැක්විණි. පරීක්ෂණය සඳහා f (1) හි ඇති රාශියෙන් වන බලපෑම කුමක්ද?

.....................................................................................................................................

.....................................................................................................................................

3. එය මග හරවා ගැනීමට කල හැකි ක්‍රියාමාර්ගයක් ලියා දක්වන්න.

.....................................................................................................................................

.....................................................................................................................................

(g) $E_1 = 1.018V$ වන වෙස්ටන් කෝෂයකි. ඒ සඳහා සංතුලන දිග $42cm$ වේ.

1. විභවමාන නියතය ගණනය කරන්න.

.....................................................................................................................................

.....................................................................................................................................

2. විභවමාන කම්බියේ දිග $2m$ නම් එමඟින් මැනිය හැකි උපරිම වි.ගා.බා. සොයන්න.

.....................................................................................................................................

.....................................................................................................................................

3. ඉහත $E_1$ , $E_2$ කෝෂ ඉවත් කර මෙම පරිපථයේ $xy$ අතරට විභවමානය සම්බන්ධ කල විට සංතුලන දිග ගණනය කරන්න.




.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education Westerns Province

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025**
**General Certificate of Education (Adv. Level) Examination, 2025**
**අවසාන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය**

භෞතික විද්‍යාව II
Physics II

**B කොටස - රචනා**

**01 S II**

ප්‍රශ්න **හතරකට පමණක්** පිළිතුරු සපයන්න.
$(g = 10\,ms^{-2})$

**05.** වැවක පතුලේ තිබෙන තිබෙන පාෂාණ සහ රොන්මඩ තට්ටුව නිරීක්ෂණය කිරීම සඳහා සිසුන් පිරිසක් නිර්මාණය කරන ලද කිමිදුම් ටැංකියක් පහත දැක්වේ. මෙය විශාල බෝට්ටුවක් මගින් වැවේ ජල පෘෂ්ඨය මතුපිටට සීරුවෙන් නිදහස් කරනු ලබයි. මෙම ටැංකියට කෘතිමව ඔක්සිජන් වායු සැපයුමක් අභ්‍යන්තරිකව නිෂ්පාදනය කරනු ලබයි. එක් සිසුවෙකුට කුටිය තුළ රැඳී සිටිය හැකි අතර තිරස්ව චලනය කළ හැකි පිස්ටනයක් මගින් අභ්‍යන්තර පරිමාව වෙනස් කළ හැකිය. කුටිය තුළට ජලය ඇතුළු නොවන පරිදි සකසා ඇත. සියලු දුස්ස්‍රාවී බල නොසලකා හැරිය හැක.




කුටිය පාරදෘශ්‍ය වීදුරුවලින් තනා ඇති අතර එම බිත්ති සහ පිස්ටනය මගින් විස්තාපනය වන ජල පරිමාව නොගිණිය හැක.

(a) (i) සිසුවා සමග කිමිදුම් ටැංකියේ මුළු ස්කන්ධය $1500\,kg$ නම් එය ජලයට නිදහස් කළ පසු ආරම්භයේ දී ජලයේ ගිලී පාවෙන උස ගණනය කරන්න. ආරම්භයේ දී $L = L_0 = 4\,m$ වේ. ජලයේ ඝනත්වය $1000\,kg\,m^{-3}$ වේ.

(ii) කිමිදුම් ටැංකිය සම්පූර්ණයෙන්ම ජල මට්ටමට පහළින් පිහිටන සේ ගිල්වීමට පිස්ටනය චලනය කළ යුතු දුර සහ දිශාව සොයන්න.

(iii) ජලය මගින් බිත්තිය මත ඇති කරන සඵල ප්‍රතිරෝධී බලය සහ පීඩනය නිසා හට ගන්නා බලය $200\,N$ නම් පිස්ටනය ඉවතට චලනය කිරීම සඳහා යෙදිය යුතු අවම බලය කොපමණ ද?

(b) (i) කිමිදුම් ටැංකිය $1ms^{-2}$ ත්වරණයෙන් වැවේ පතුල කරා ගමන් කරවීමට, ටැංකියේ අභ්‍යන්තර දිගෙහි පවත්වාගත යුතු අගය $(L_1)$ කීය ද?

(ii) ඉහත $(b)\,(i)$ ගණනය කළ $L_1$ අවස්ථාවේ දී ඇතිවන ප්‍රායෝගික ගැටලුව කුමක් ද?

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

(c) (i) පරීක්ෂණ කටයුතු සිදු කිරීමෙන් පසු වැව් පතුලෙන් එකතු කර ගත් ද්‍රව්‍යවල මුළු ස්කන්ධය $2500\ kg$ වේ. ඉන්පසු කිමිදුම් ටැංකිය පරිමාව $7\ m^3$ දක්වා සකසා නැවත ජල පෘෂ්ඨය මතුපිටට පැමිණීමට බලාපොරොත්තු වේ. ජල ප්‍රතිරෝධය නොසලකා හැරිය විට එහි ත්වරණය ගණනය කරන්න.

(ii) වැවේ එම පිහිටුමේ දී ගැඹුර $25\ m$ නම් එය ජල පෘෂ්ඨයට ළඟා වන වේගය කොපමණ ද? කිමිදුම් ටැංකිය නිශ්චලතාවයෙන් ගමන් අරඹන බව සලකන්න. $(\sqrt{15} \approx 3.9)$

**06.** (a) (i) කාචවලට ආලෝක කිරණ පතනය වීමෙන් සිදුවන වර්තනය සඳහා භාවිතා කරන කාටීසියානු ලකුණු සම්මුතිය ලියා දක්වන්න.

(ii) අවතල කාචයක් මගින් ප්‍රධාන අක්ෂයට ආනතව පැමිණෙන කිරණයකට අදාළව තාත්වික සහ අතාත්වික වස්තු දෙකක් සඳහා ප්‍රතිබිම්බය නිර්මාණය විමට අදාළව **කිරණ රූප සටහන් දෙකක්** අඳින්න.

(iii) ඉහත රූප සටහන් දෙක තෘප්ත කරන මූලධර්මය කුමක් ද?

(b) උත්තල සහ අවතල කාච සංයුක්තයක් මගින් භෞතික විද්‍යා ප්‍රදර්ශනයක් සඳහා සාදන ලද නිර්මාණයක කාච සැකසුමක් පහත රූපයේ දැක්වේ. නාභිය දුර $f_1$ වන උත්තල කාචයක් සහ නාභිය දුර $f_2$ වන අවතල කාචයකින් එය සමන්විත වේ. කාච අතර පරතරය $x$ වෙනස් කළ හැක. මේ සඳහා යාන්ත්‍රික උපක්‍රමයක් භාවිතා කරනු ලබයි.




1 රූපය

(i) I හි තාත්වික ප්‍රතිබිම්බයක් සෑදීම සඳහා $f_1$ සහ $x$ අතර තෘප්ත කළ යුතු අසමානතාවය කුමක් ද?

(ii) උත්තල කාචය මගින් අභිසාරී කරන ආලෝක කිරණය අවතල කාචයට පතනය වීමෙන් පසු අවතල කාචයේ සිට අවසාන ප්‍රතිබිම්බයට ඇති දුර සොයන්න.

කාච සංයුක්තයේ සඵල නාභීය දුර සෙවීමට ශිෂ්‍යයෙක් නිර්මාණය කළ කිරණ රූප සටහනක් පහත 2 රූපයේ දැක්වේ. ප්‍රකාශ අක්ෂයේ සිට $y_0$ උසකින් උත්තල කාචය මත පතනය වන සමාන්තර ආලෝක කිරණයක් අවතල කාචයට ඇතුළුවන විට ප්‍රධාන අක්ෂයේ සිට $y$ උසකින් පිහිටයි.




2 රූපය

(iii) සමකෝණී ත්‍රිකෝණ හෝ ත්‍රිකෝණමිතික අනුපාත සැලකීමෙන් $y$ සඳහා ප්‍රකාශනයක් $y_0$ , $f_1$ සහ $x$ ඇසුරෙන් ගොඩනගන්න.

(c) ඉහත 1 රූපයේ පෙන්වා ඇති අවතල කාචයෙන් නිර්ගත වී $I$ අවසාන ප්‍රතිබිම්බය සාදන කිරණය ආපස්සට (වම් දිශාවට) දික් කළ විට $A$ හි දී පතන කිරණය ඡේදනය කරයි. කාච සංයුක්තයේ සඵල නාභීය දුර අර්ථ දැක්වෙන්නේ **$A$ සිට $I$ ට ප්‍රධාන අක්ෂය දිගේ ඇති දුර** වන පරිදි වන අතර එය $f$ වේ. එම නාභීය දුර $\frac{1}{f} = \frac{1}{f_1} - \frac{1}{f_2} + \frac{x}{f_1 f_2}$ සම්බන්ධතාව ලබා දෙන බව පෙන්වන්න.

(d) (i) $f_1 = 10\ cm, f_2 = 20\ cm$ සහ $x$ හි අගය 0 සිට $6\ cm$ දක්වා විචලනය කළ හැකි නම් මෙම යෙදවුමේ අවම හා උපරිම නාභීය දුරවල් සොයන්න.

(ii) මෙම උපකරණය වැඩිදියුණු කිරීමෙන් යොදාගත හැකි අවස්ථාවක් සඳහන් කරන්න.

**07.** පහත දී ඇති ප්‍රස්තාරයේ සුපුරුදු සංකේතවලින් $\left(\frac{\Delta l}{l}\right)$ එදිරියෙන් $\left(\frac{F}{A}\right)$ ප්‍රස්තාර ගත කොට ඇත.



1 රූපය

(a) (i) $\left(\frac{\Delta l}{l}\right)$ සහ $\left(\frac{F}{A}\right)$ හඳුන්වන්න.

(ii) $A$ සහ $B$ ලක්ෂ්‍යයන් හඳුන්වන්න.

(iii) $\left(\frac{F}{A}\right)$ සහ $\left(\frac{\Delta l}{l}\right)$ සම්බන්ධ කරමින් සමීකරණයක් ලියා දක්වන්න. ඔබ යොදා ගන්නා වෙනත් සංකේත ඇතොත් ඒවා හඳුන්වන්න.

(b) සුළං සහිත අවස්ථාවල දී උස පොල් ගස් ඉදිරී වැටී යාම දක්නට ලැබේ. මෙය වළක්වා ගැනීමට පොල් ගසේ ඉහළින් ගැට ගැසූ වානේ කේබලයක් මගින් එම ගස වෙනත් ශක්තිමත් ගසක ගැට ගසනු ලැබේ. එක්තරා පොල් ගසක් ගැට ගැසීම සඳහා $25\ m$ ක සමාන දිගකින් හා හරස්කඩ වර්ගඵලය $0.8 cm^2$ සහ $0.5 cm^2$ වන ඒකාකාර වානේ කම්බි දෙකක් එකිනෙකට සම්බන්ධ කොට ඇත්තේ $50\ m$ සරල රේඛීය දිගක් ඇදී පවතින සංයුක්ත කම්බියක් සෑදෙන පරිදිය. මෙහිදී ගැටගැසීම සඳහා කම්බි දෙකේම දෙකෙලවරින් අමතරව යම් දිගක් භාවිතා කර ඇත. ගණනය සඳහා එමගින් ඇතිවන බලපෑම නොසලකා හරින්න. වානේවල යංමාපාංකය $2 \times 10^{11}\ N\ m^{-2}$ වානේවල සමානුපාතික සීමාවට අදාළ ප්‍රත්‍යාබලය $2.5 \times 10^{8}\ N\ m^{-2}$.

(i) පළමුව සමානුපාතික සීමාවට එළඹෙන්නේ කුමන හරස්කඩ සහිත කම්බිය ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

(ii) මෙම අවස්ථාවේ දී සංයුක්ත කම්බියට සමානුපාතික සීමාව ඉක්ම නොයන පරිදි දැරිය හැකි උපරිම ආතති බලය කුමක් ද?

(c) (i) තද සුළඟක් ඇති අවස්ථාවල දී පළමුව කැඩී යන්නේ කුමන කම්බිය ද?

(ii) වානේවල භේදක ප්‍රත්‍යාබලය $3.1 \times 10^{8}\ N\ m^{-2}$ නම් කම්බිය කැඩී යන අවස්ථාවේ දී එහි පැවතිය හැකි උපරිම ආතති බලය කොපමණ ද?

(d) (i) වඩා වැඩි ආතති බලයකට ඔරොත්තු දීම සඳහා මෙම කම්බි දෙකම ($25\ m$ දිග බැගින්) යොදා ගත හැකි වෙනත් ක්‍රමයක් යෝජනා කරන්න.

(ii) කම්බි දෙක එකිනෙකට සමාන්තර වන සේ ඒවායේ කෙළවරවල් එකිනෙකට සම්බන්ධ කොට දිගින් $25\ m$ වන සංයුක්ත කම්බියක් සාදා ඇත්නම්, සමානුපාතික සීමාව ඉක්මවා නොයන පරිදි මෙම සංයුක්ත කම්බියට දැරිය හැකි උපරිම ආතති බලය කොපමණ ද?

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

**08.** පහත ඡේදය කියවා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අභ්‍යවකාශ මධ්‍යස්ථාන ඉදිකිරීම වර්තමානයේ දී සාර්ථකව ජය ගත් විෂය ක්ෂේත්‍රයකි. ජාත්‍යන්තර අභ්‍යවකාශ මධ්‍යස්ථානය $(ISS)$ යනු මේ වනවිට මිනිසා නිපදවා ඇති මිනිසුන් කිහිප දෙනෙකුට වාසය කල හැකි , පහල පෘථිවි කක්ෂය තුල රඳවා ඇති විශාල කෘතිම චන්ද්‍රිකාවකි. මෙය අභ්‍යවකාශ යානාවක් ලෙසද හැඳින්විය හැක. මේ සඳහා රටවල් 15 ක පමණ අභ්‍යාවකාශ ඒජන්සි දායක වී ඇත. මෙය තැනීමේ මූලිකම පරමාර්ථය වී ඇත්තේ ක්ෂුද්‍ර ගුරුත්වාකර්ෂණ තත්ව යටතේ ජීව විද්‍යාව , මානව ජීව විද්‍යාව, භෞතික විද්‍යාව, තාරකා විද්‍යාව සහ අනෙකුත් සියලු අංශයන්ගේ පර්යේෂණ පැවත් වීමට හැකි පර්යේෂණාගාරයක් ලෙස භාවිතයට ගැනීමයි. ඉදිරි අභ්‍යාවකාශ ගමන් වලට යොදා ගන්නා උපකරණ අත්හදා බැලීමේ පර්යේෂණාගරයක් ලෙසද මෙය භාවිතා කෙරේ.

වර්තමානයේ දී යෝජනා කරන ලද තවත් අභ්‍යාවකාශ මධ්‍යස්ථානයක් පෘතුවි පෘෂ්ඨයේ සිට $3600\, km$ දුරකින් ඉදිකිරීමට බලාපොරොත්තු වේ. මෙය පෘථිවිය වටා භ්‍රමණය කරවිමට නියමිතය. මේ සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ගෙන යාමට එය පවත්වා ගනු ලබන කක්ෂයේ ගුරුත්වාකර්ෂණ විභව ශක්තිය සහ පෘථිවි පෘෂ්ඨය මත ගුරුත්වාකර්ෂණ විභව ශක්තිය අතර ශක්ති වෙනසට සමාන බාහිර ශක්තියක් ලබා දිය යුතුය.

අභ්‍යාවකාශ මධ්‍යස්ථානවල බලශක්ති උත්පාදනය සම්පූර්නයෙන්ම සූර්ය ශක්තිය $(solar\ panels\ arrays)$ මගින් සිදුවන අතර අභ්‍යාවකාශ මධ්‍යස්ථානයේ බඳෙහි සූර්ය පැනල සවිකර ඇත. සූර්ය පැනල සවිකර ඇති සඵල වර්ගඵලය සාමාන්‍යයෙන් $500\, m^2$පමණ වේ.

(a) (i) ජාත්‍යන්තර අභ්‍යවකාශ මධ්‍යස්ථානය පිහිටා ඇත්තේ පෘථිවියට ඉහලින් ඇති කුමන ප්‍රදේශයේ ද?

(ii) ජාත්‍යන්තර අභ්‍යවකාශ මධ්‍යස්ථානය තැනීමේ මූලික පරමාර්ථ දෙකක් සඳහන් කරන්න.

(iii) පෘථිවි පෘෂ්ඨය මත ගුරුත්වජ ත්වරණය $g$ ද සාර්වත්‍ර ගුරුත්වාකර්ෂණ නියතය $G$ ද පෘථිවියේ ස්කන්ධය $M$ සහ පෘථිවියේ අරය $R$ ද නම් $g = \frac{GM}{R^2}$ බව පෙන්වන්න.

(b) (i) පෘථිවියේ අරය $6400\, km$ ලෙස ද පෘථිවි පෘෂ්ඨය මත ගුරුත්වජ ත්වරණය $10\, m\, s^{-2}$ ලෙසද ගෙන යෝජිත අභ්‍යවකාශ මධ්‍යස්ථානය පෘථිවිය වටා පරිභ්‍රමණය වන ස්පර්ශීය වේගය සොයන්න.

(ii) පෘථිවි පෘෂ්ඨයේ සිට අභ්‍යවකාශ මධ්‍යස්ථාන කක්ෂයට ඇති දුර $h$ නම් $m$ ස්කන්ධයක් අභ්‍යවකාශ මධ්‍යස්ථාන කක්ෂයේ ඇතිවිට එහි ගුරුත්වාකර්ෂණ විභව ශක්තිය සඳහා ප්‍රකාශනයක් $G, M, R, h$ සහ $m$ ඇසුරෙන් ලියා දක්වන්න.

(iii) එම $m$ ස්කන්ධය පෘථිවි පෘෂ්ඨය මත ඇති විට අභ්‍යවකාශ මධ්‍යස්ථාන කක්ෂයේ එහි ගුරුත්වාකර්ෂණ විභව ශක්තිය සඳහා ඉහත ආකාරයේ ප්‍රකාශනයක් $G, M, R$ සහ $m$ ඇසුරෙන් ලියා දක්වන්න.

(iv) $m$ ස්කන්ධයක් අභ්‍යවකාශ මධ්‍යස්ථාන කක්ෂයට යාන්තමින් ළඟාවීමට සැපයිය යුතු අවම ශක්තිය $\frac{GMmh}{R(R+h)}$ බව පෙන්වන්න.

(v) ඉහත (a) (iii) පිළිතුර සහ (b) (iv) පිළිතුරු භාවිතයෙන් $m$ ස්කන්ධයක් අභ්‍යවකාශ මධ්‍යස්ථාන කක්ෂයට යාන්තමින් ළඟාවීමට සැපයිය යුතු අවම ශක්තිය $\frac{mgRh}{(R+h)}$ බව පෙන්වන්න.

(vi) ඡේදයේ ඇති දත්ත ඇසුරෙන් $10\,000\, kg$ ස්කන්ධයක් සහිත භාණ්ඩ සහ අභ්‍යවකාශගාමීන් සහිත කුඩා යානයක් අභ්‍යවකාශ මධ්‍යස්ථාන කක්ෂයට යාන්තමින් ළඟාවීමට සැපයිය යුතු අවම ශක්තිය ගණනය කරන්න.

(c) (i) අභ්‍යවකාශ මධ්‍යස්ථානයේ කක්ෂය වෙනස් නොකර ස්කන්ධය $10\,000\ kg$ වන එම යානය අභ්‍යවකාශ මධ්‍යස්ථානය හා සම්බන්ධ වීම සඳහා අවශ්‍ය අමතර ශක්තිය කොපමණ ද?

(ii) අභ්‍යවකාශ මධ්‍යස්ථානය සමග යානය සම්බන්ධ වීමෙන් පසු යානයේ සිටින ගගනගාමීන් සහ තිබෙන භාණ්ඩ අභ්‍යවකාශ මධ්‍යස්ථානය තුළට පැමිණේ. මෙම ක්‍රියාවලියෙන් පසු අභ්‍යවකාශ මධ්‍යස්ථානයේ නව ස්පර්ශීය වේගය වෙනස් වේ ද? ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න.

(d) සූර්යාලෝකය අභ්‍යාවකාශ මධ්‍යස්ථානයේ බඳෙහි සවිකර ඇති සූර්ය පැනල සමග ලම්බකව පතනය වන බව උපකල්පනය කර $2000\ Wm^{-2}$ සීඝ්‍රතාවයකින් සූර්ය ශක්තිය පැය 6 ක කාලයක් ඒකාකාරව අභ්‍යවකාශ මධ්‍යස්ථානය මත පතනය වූ විට උත්පාදනය වන විද්‍යුත් ශක්තිය සොයන්න. සූර්ය පැනලවල කාර්යක්ෂමතාවය $90\ \%$ ක් ලෙස සලකන්න

**09. (A) කොටසට හෝ (B) කොටසට හෝ පමණක් පිළිතුරු සපයන්න.**

**(9A) කොටස**

හිසකෙස් වියලන යන්ත්‍රයක $(Hair\ dryer)$ උණුසුම් වායු ධාරාවක් ලබා ගැනීමට පාසල් සිසුවෙක් නිපදවන ලද පරිපථයක් පහත රූපයේ දැක්වේ.




මෙම පරිපථය සඳහා උච්ච අගය $315\ V$ වන ප්‍රත්‍යාවර්ථ වෝල්ටියතාවයකින් විදුලිබලය සපයයි. $X$ සහ $Y$ යනු සර්වසම තාපන දඟර දෙකකි. සුළං පෙත්තේ වේගය එය හරහා ගලා යන ධාරාවට අනුලෝමව සමනුපාතික වේ.

(a) (i) වර්ග මධ්‍යන්‍ය මූල වෝල්ටියතාවය $(V_{r.m.s})$ යනු කුමක් ද?

(ii) වර්ග මධ්‍යන්‍ය මූල වෝල්ටියතාවය $(V_{r.m.s})$ සහ අනුරූප උච්ච වෝල්ටියතාවය $(Peak\ Voltage - V_P)$ අතර සම්බන්ධය ලියා දක්වන්න.

